රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2017 (I)

මගේ අංකය : R/9/2/2017

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය,

නිදහස් චතුරශ්‍රය,

කොළඹ 07.

2017 නොවැම්බර් මස 30 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,

දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**<u>කුසලතා පදනම මත රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියට උසස් කිරීමේ තරග විභාගය - 2017</u>**

උක්ත විභාගයට අදාල රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2017හි 3 ඡේදයේ පළමු වගන්තිය 6 (ඇ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසාන දිනය සහ 7 (ඇ) ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

**I. 3 ඡේදයෙහි පළමු වගන්තිය පමණක් පහත පරිදි සංශෝධනය වේ.**

අධිශ්‍රේණියේ පුරප්පාඩු වලින් 50% ක ප්‍රමාණයකට අදාල පත්කිරීම් කුසලතා පදනම මත සිදු කරනු ලබන අතර ඒ අනුව පුරවනු ලබන පුරප්පාඩු ගණන 143 කි.

**II.** 6 (ඇ) ඡේදයෙහි අයදුම්පත් කැඳවන අවසන් දින **2017.12.31** දක්වා දීර්ඝ කරනු ලැබේ. ඒ අනුව, අයදුම්කරුවන් 2017.12.31 දින වන විට සියලු සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**III. 7 (ඇ) ඡේදය පහත පරිදි සංශෝධනය වේ.**

අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබිණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයෙහි පිටපතද අතැතිව, විභාගයේ නම, ඔබගේ සම්පූර්ණ නම හා ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර හා ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත.

IV. මෙම විභාගය සඳහා මේ වන විටත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් එවීමෙන් වළකින ලෙස දැනුම් දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි

ජේ.ජේ. රත්නසිරි

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය